## විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>

මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1:2:1 <u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1999 අප්‍රේල් 09 දින හා අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරීන් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 25% ක මුදලින් 10% ක් විශ්‍රාම අරමුදලට බැර කළ යුතු වේ. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මගින් සේවායා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 15% ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. |
| (ආ) | කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2005 ජනවාරි 28 දින හා අංක පා/ආයතන/2004 දරන ලිපිය සහ 2001 අගෝස්තු 24 දින හා අංක 5/ආයතන/11දරන ලිපිය. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක මුදල් ගණනය කිරීම සහ පාර්තෝෂික ගණනය කිරීම සඳහා අධ්‍යයන දීමනා සැලකිල්ලට නොගත යුතු බව කම්කරු කොමසාරිස් ජනරාල් වාර්තා කර තිබියදී විශ්‍රාම අරමුදලට අදාල දායකය ගණනය කිරීම සඳහා අධ්‍යයන දීමනා අදාල කරගෙන තිබුණි. මේ අනුව 2004 |

වර්ෂයේ සිට 2011 මැයි දක්වා විශ්‍රාම වැටුප් අරමුදලට වැඩියෙන් බැර කර ඇති මුදල දළ වශයෙන් රු.මිලියන 194 කි.

2. **මූල්‍ය සමාලෝචන**

2:1. **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ රු. 61,151,399 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු. 25,105,595 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 36,045,804 ක වර්ධනයක් සඳහා ස්ථාවර තැන්පතු පොළී ආදායම් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

1999 සැප්තැම්බර් 01 දින පිහිට වූ අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව 111 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් රු. 16,867,284 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේදී විශ්‍රාමිකයන්ගේ අරමුදලේ බැරට ඇති ශේෂය රු. 76,114,209 ක් වූ අතර එම ශේෂයෙන් ඉදිරියට විශ්‍රාම වැටුප් ගෙවිය හැකි වනුයේ ඉදිරි වර්ෂවල පැවතිය හැකි වගකීම් නොසලකා වුවද දළ වශයෙන් වර්ෂ 4 1/2 ක කාලයක් සඳහා පමණක් බවට නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ විශ්‍රාමිකයන්ගේ පෞද්ගලික ගිණුම් වල ශේෂයක් නොතිබියදී රු. 1,303,638 ක මුදලක් සාමාජිකයන් එකොළොස් දෙනෙකුට විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබුණි.

3.2. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) විශ්‍රාම යැමේදී අවුරුදු 20 ක සේවාකාලයක් සම්පූර්ණ නොකළ සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුමේ බැරට ඇති දායක මුදල හා පොළිය ආපසු ගෙවීමට කටයුතු කිරීමේදී අයදුම්පතෙහි අඩුපාඩු සපුරා නිරවුල් කිරීමෙන් පසු විශ්‍රාම අයදුම්පත විශ්‍රාම වැටුප් අංශය වෙත ඉදිරිපත් කළ දිනය හා විශ්‍රාම ලාභියාට හිමි මුදල ගෙවන දිනය අතර දීර්ඝ ප්‍රමාදයක් පවතින බවද නිරීක්ෂණය විය.

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) විශ්‍රාම වැටුප් ගෙවීම

(ආ) දායකය ගණනය කිරීම